අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2011 දෙසැම්බර්

General Certificate of Education (Ord. Level) Examination – December 2011

බුද්ධ ධර්මය I / පැය එකයි

Buddhism I / One hour

සැලකිය යුතුයි:

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**

---

01. සිදුහත් බෝසතාණන් වහන්සේ උපත ලද විගස ම පියවර හතක් ගමන් කොට "මේ මාගේ අවසන් උපතයි. දැන් නැවත භවය ඇතිවීමක් නැත" යි ප්‍රකාශ කළහ. එම ප්‍රකාශය ඇතුළත් පාඨය වන්නේ,
(1) 'අනේක ජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං' යන්නයි.
(2) 'සුඛෝ බුද්ධානං උප්පාදෝ' යන්නයි.
(3) 'අයමන්ති මා ජාති - නත්ථිදානි පුනබ්භවෝ' යන්නයි.
(4) 'හේතුං පටිච්ච සම්භූතං - හේතුභංගා නිරුජ්ඣති' යන්නයි.

02. සිදුහත් කුමාරයා මතු බුදුවන බවට අනාවැකියක් කී මුල් ම තැනැත්තා වූයේ,
(1) කොණ්ඩඤ්ඤ බමුණායි.
(2) ආලාර කාලාමයි.
(3) සහම්පති බ්‍රහ්මයායි.
(4) අසිත තවුසායි.

03. "මිනිස් පරපුර නමැති වෘක්ෂයේ අපමණ කලකට පසුව පිපෙන, පිපුණාට පසුව ප්‍රඥා, සුගන්ධයෙන් සහ කරුණා මකරන්දයෙන් ලෝකය පුරවන අසාමාන්‍ය පුෂ්පය බුදුරජාණන් වහන්සේ ය." මෙලෙස ප්‍රකාශ කළේ,
(1) ආචාර්ය සර්වපල්ලි රාධ කෘෂ්ණන් ය.
(2) එච්.ජී. වේල්ස් ය.
(3) සර් එඩ්වින් අර්නෝල්ඩ් ය.
(4) ජවහර්ලාල් නේරු ය.

04. "පුණ්ඩරීකං යථා වග්ගු - තෝයේන නුපලිප්පති" යන ගාථාවේ දක්වෙන පරිදි බුදුරජාණන් වහන්සේ කෙලෙස් හරිත ලෝකයේ කෙලෙස්වලින් තොරව, නොගැටී වැඩ සිටීම,
(1) පද්මාකාර ජීවිතය නමින් හැඳින්වේ.
(2) අනගාරික ජීවිතය නමින් හැඳින්වේ.
(3) අසමාහිත ජීවිතය නමින් හැඳින්වේ.
(4) කාරුණික ජීවිතය නමින් හැඳින්වේ.

05. සංසාර සාගරයෙන් එතෙර යාමට උපකාරවන ධර්ම සමූහය,
(1) සමජීවිකතා නම් වේ.
(2) පාරමිතා නම් වේ.
(3) කුසලතා නම් වේ.
(4) පින්කිරියවත් නම් වේ.

06. අප මහා බෝසතාණන් වහන්සේ ප්‍රඥා පාරමිතාව සම්පූර්ණ කළ ආකාරය පැහැදිලි වන්නේ,
(1) ලෝමහංස ජාතකයෙනි.
(2) සස ජාතකයෙනි.
(3) තේමිය ජාතකයෙනි.
(4) උම්මග්ග ජාතකයෙනි.

07. පුද්ගලයාගේ සිත කිලිටි කෙරෙන, නිවන් මග අවුරාලන, ක්ලේශ ධර්ම යටපත් කිරීම පමණක් කෙරෙන භාවනාව,
(1) සමථ භාවනා නම් වේ.
(2) විදර්ශනා භාවනා නම් වේ.
(3) ආනාපානසති භාවනා නම් වේ.
(4) ප්‍රඥා භාවනා නම් වේ.

08. ගිහි බෞද්ධයන් රැකිය යුතු නිත්‍ය ශීලය,
(1) පංච ශීලයයි.
(2) අෂ්ටාංග ශීලයයි.
(3) දශ ශීලයයි.
(4) ආජීව අෂ්ටමක ශීලයයි.

09. "සබ්බේ සංඛාරා අනිච්චා" සියලු සංස්කාරයෝ අනිත්‍යයහ. යනාදී වශයෙන් මෙනෙහි කරමින් කරනු ලබන භාවනාව,
(1) කමටහන් භාවනාව නම් වේ.
(2) කසිණ භාවනාව නම් වේ.
(3) සමථ භාවනාව නම් වේ.
(4) විපස්සනා භාවනාව නම් වේ.

EXAMMOOD.LK

10. පුද්ගලයා තමාටත් සමාජයටත් හිතකර, කායික වාචසික හා මානසික ක්‍රියාවන්ගෙන් යුක්තව, ගුණ දහමින් වැඩි දියුණු වීම හැඳින්වෙන්නේ,
(1) භෞතික සංවර්ධනය නමිනි.
(2) ආධ්‍යාත්මික සංවර්ධනය නමිනි.
(3) සමාජ සංවර්ධනය නමිනි.
(4) ලෞකික සංවර්ධනය නමිනි.

11. පාපය, අකුසලය නොකර හැරීම, ඉන් දුරුවීම බුදු දහමේ හැඳින්වෙන්නේ,
(1) සමාදාන ලෙස ය.
(2) කරණීය ලෙස ය.
(3) විරමණ ලෙස ය.
(4) ව්‍රත පරාමර්ශනය ලෙස ය.

12. "සුවසේ කා බී වසන දක්ෂ කපුටකු වැනි ය." යනුවෙන් ධම්මපද දේශනාවක උපමා කර ඇත්තේ,
(1) අධර්මයෙන් උපයා යැපෙන තැනැත්තා ය.
(2) අලසව සිටින තැනැත්තා ය.
(3) කා බී ජීවත්වන තැනැත්තා ය.
(4) නිර්ධන තැනැත්තා ය.

13. බුදු දහමෙහි පෙන්වා දී ඇති වැරදි වෙළඳාම් ආදියෙන් වැළකී දිවි පැවැත්ම,
(1) සම්මා කම්මන්ත නම් වේ.
(2) සම්මා ආජීව නම් වේ.
(3) සම්මා වායාම නම් වේ.
(4) සම්මා සති නම් වේ.

14. සත්ත්වයා ඉපදෙමින් මැරෙමින් පවත්නා ආකාරය දක්නා නුවණ,
(1) චුතූපපාත ඤාණය නම් වේ.
(2) ආසවක්ඛය ඤාණය නම් වේ.
(3) පුබ්බේ නිවාසානුස්සති ඤාණය නම් වේ.
(4) දිබ්බ චක්ඛු ඤාණය නම් වේ.

15. "චතුරාර්ය සත්‍යය නොදැනීම හෙවත් අවිද්‍යාව ඇති කල්හි කුසලාකුසල කර්ම රැස් කිරීම හෙවත් සංස්කාර ඇති වේ." මෙය ප්‍රකාශ වන්නේ,
(1) "අවිජ්ජා පච්චයා සංඛාරා" යන්නෙනි.
(2) "සංඛාර පච්චයා විඤ්ඤාණං" යන්නෙනි.
(3) "විඤ්ඤාණ පච්චයා නාමරූපං" යන්නෙනි.
(4) "උපාදාන පච්චයා භවො" යන්නෙනි.

16. "සරු දේ සරු හැටියටත් නිසරු දේ නිසරු හැටියටත් දැන, නිවැරදි කල්පනාවෙන් යුත් අය සාරධර්මයක් ම ලබති." මෙම අදහස ගැබ්වන ධම්මපද ගාථාවේ මුල් **දෙපදය** වන්නේ,
(1) "වරං වේ නාධිගච්ඡෙය්‍ය - සෙය්‍යං සදිස මත්තනො" යන්නයි.
(2) "සාරං ච සාරතො ඤත්වා - අසාරංච අසාරතො" යන්නයි.
(3) "අක්කොච්ඡි මං අවධිමං - අජිනි මං අහාසි මෙ" යන්නයි.
(4) "උට්ඨානවතො සතීමතො - සුචිකම්මස්ස නිසම්මකාරිනො" යන්නයි.

17. බුදුරජාණන් වහන්සේ සසර දුක් ඇතිවන හා නැතිවන ආකාරය පෙන්වා දීමට මෙන්ම සමාජගත දුක ඇතිවන හා නැතිවන ආකාරය පෙන්වා දීමට උපයෝගී කරගත් දහම,
(1) පටිච්ච සමුප්පාදයයි.
(2) අනාත්මවාදයයි.
(3) පුබ්බේකත හේතුවාදයයි.
(4) ලෝකායතවාදයයි.

18. පංච නීවරණ ධර්ම අතරට ගැනෙන සිතෙහි නොසන්සුන් ගතිය හඳුන්වන්නේ,
(1) කාමච්ඡන්ද නමිනි.
(2) ව්‍යාපාද නමිනි.
(3) ථීන මිද්ධ නමිනි.
(4) උද්ධච්ච කුක්කුච්ච නමිනි.

19. සතර සංග්‍රහ වස්තුවල එන අත්ථ චරියා යන්නෙන් අදහස් වන්නේ,
(1) ආර්ථික දියුණුවයි.
(2) අන් අයට උදව් කිරීමයි.
(3) දෙලොව දියුණුවයි.
(4) තම දියුණුව සලසා ගැනීමයි.

20. කර්මය හා කර්ම විපාකය පිළිබඳවත්, සත්ත්වයින්ගේ විවිධත්වයට හේතුවත් පැහැදිලි කරමින් දේශනා කළ සූත්‍රධර්මය,
(1) චුල්ලකම්ම විභංග සූත්‍රයයි.
(2) අනන්තලක්ඛණ සූත්‍රයයි.
(3) සිඟාලෝවාද සූත්‍රයයි.
(4) වීමංසක සූත්‍රයයි.

EXAMMOOD.LK

21. ඵළඟ උත්පත්තියේ දී හෙවත් දෙවන භවයේදී ස්ථිරව ම විපාක දෙන කර්ම,
(1) දිට්ඨධම්මවේදනීය කම්ම නමින් හැඳින්වේ.
(2) උපපජ්ජවේදනීය කම්ම නමින් හැඳින්වේ.
(3) අපරාපරියවේදනීය කම්ම නමින් හැඳින්වේ.
(4) අහෝසි කම්ම නමින් හැඳින්වේ.

22. විපාකදීමට ඉදිරිපත් වන අනුපිළිවෙළ අනුව කර්මය බෙදා දැක්වීමේ දී ජීවිතයේ නිතර නිතර පුරුදු පුහුණු කරනු ලැබූ කර්ම හඳුන්වන්නේ,
(1) ගරුක කර්ම ලෙස ය.
(2) ආසන්න කර්ම ලෙස ය.
(3) ආචිණ්ණ කර්ම ලෙස ය.
(4) කටත්තා කර්ම ලෙස ය.

23. සමස්ත ලෝකයේ ක්‍රියාත්මක වන ස්වභාවය, නියාම ධර්ම ලෙස හඳුන්වන අතර කාලගුණික වෙනස්කම් හේතුඵල අනුරූපීව සිදුවීම හඳුන්වන්නේ,
(1) උතු නියාම නමිනි.
(2) බීජ නියාම නමිනි.
(3) ධම්ම නියාම නමිනි.
(4) චිත්ත නියාම නමිනි.

24. සතර අපා, මිනිස් ලොව හා සදෙව් ලොව යන මේ සත්ත්වයින් උපදින ස්ථාන එකොළහ,
(1) කාම ලෝක නමින් හැඳින්වේ.
(2) රූප ලෝක නමින් හැඳින්වේ.
(3) අරූප ලෝක නමින් හැඳින්වේ.
(4) බ්‍රහ්ම ලෝක නමින් හැඳින්වේ.

25. ගිහියකුට අත්විඳිය හැකි සැප අතර ණය බරින් තොරව ජීවත් වීමේ සතුට,
(1) අත්ථි සුඛයයි.
(2) භෝග සුඛයයි.
(3) අණන සුඛයයි.
(4) අනවජ්ජ සුඛයයි.

26. "පුද්ගලයාගේ මෙලොව පරලොව දියුණුවට සහ පරිහානියට ඉවහල් වන කරුණු පැහැදිලි කරමින් දේශනා කළ සූත්‍ර ධර්ම **දෙක** පිළිවෙළින්,
(1) මංගල සූත්‍රය, කරණීය මෙත්ත සූත්‍රය
(2) පරාභව සූත්‍රය, සිඟාලෝවාද සූත්‍රය
(3) ධම්මික සූත්‍රය, අණන සූත්‍රය
(4) මංගල සූත්‍රය, පරාභව සූත්‍රය

27. බෞද්ධ ධාර්මික ආර්ථික ප්‍රතිපත්තියෙහි දැක්වෙන පරිදි අය අනුව වැය කරමින් මධ්‍යස්ථ ජීවිතයක් ගත කිරීම,
(1) උට්ඨාන සම්පදා නම් වේ.
(2) ආරක්ඛ සම්පදා නම් වේ.
(3) කල්‍යාණ මිත්තතා නම් වේ.
(4) සමජීවිකතා නම් වේ.

28. "ආරාධනා කොට වැඩමවා සිව්පස පුද කිරීමට සුදුසු" යන සංඝරත්නයේ ගුණය ප්‍රකාශ වන්නේ,
(1) පාහුණෙය්‍ය යන්නෙනි.
(2) දක්ඛිණෙය්‍ය යන්නෙනි.
(3) අඤ්ජලිකරණීය යන්නෙනි.
(4) ආහුණෙය්‍ය යන්නෙනි.

29. කරණීය මෙත්ත සූත්‍රයේ සඳහන් පරිදි පුද්ගලයකු ඇති කර ගත යුතු යයි දේශනා කළ ගුණාංග අතර පහසුවෙන් පෝෂණය කළ හැකිවීම යන ගුණය,
(1) 'අනතිමානි' නමින් හැඳින්වේ.
(2) 'සන්තුස්සකො' නමින් හැඳින්වේ.
(3) 'සුභරො' නමින් හැඳින්වේ.
(4) 'නිපකො' නමින් හැඳින්වේ.

30. ගුරුතුමිය හා සිසු පිරිස රෝහල වෙත පැමිණ ගිලානෝපස්ථානයෙහි යෙදුණහ. එහි දී ගුරුතුමිය සිසුන් අමතා මෙසේ පැවසුවා ය. 'බුදුරජාණන් වහන්සේත් සියතින් ම ගිලනුන්ට උපස්ථාන කරල තියෙනව. යම් පුද්ගලයෙක් ගිලනුන්ට උපස්ථාන කරයි ද ඔහු මගේ ධර්මය පිළිගත්තේ මට උපස්ථාන කරයි' යනුවෙන් දේශනා කරලත් තියෙනව. ගුරුතුමිය උපුටා දැක්වූ පාඨය වන්නේ,
(1) 'ආරෝග්‍ය පරමා ලාභා - සන්තුට්ඨි පරමං ධනං' යන්නයි.
(2) 'යො ධම්මං පස්සති සො මං පස්සති' යන්නයි.
(3) 'යො ගිලානං උපට්ඨහෙය්‍ය - සො මං උපට්ඨහෙය්‍ය' යන්නයි.
(4) 'අත්තානං උපමං කත්වා - න හනෙය්‍ය න ඝාතයෙ' යන්නයි.

EXAMMOOD.LK

31. විශාඛා මහා උපාසිකාව විසින් බුදුරජාණන් වහන්සේට පූජා කරනු ලැබූ ආරාමය,
(1) වේළුවනාරාමයයි. (2) පූර්වාරාමයයි.
(3) ජේතවනාරාමයයි. (4) න්‍යග්‍රෝධාරාමයයි.

32. තමා උපමා කොට වරදින් වැළකී සිටීමේ ක්‍රමය බුදු දහමේ හැඳින්වෙන්නේ,
(1) අන්තුපනායික ධර්ම පරියාය නමිනි. (2) සල්ලේඛ ප්‍රතිපදාව නමිනි.
(3) ධම්මාධිපතෙය්‍ය නමිනි. (4) ලෝකාධිපතෙය්‍ය නමිනි.

33. ලංකා ශාසන ඉතිහාසයේ, වළගම්බා රාජ්‍ය සමයේ භික්ෂු ශාසනය සම්බන්ධයෙන් සිදු වූ වැදගත් ම සිදුවීම වනුයේ,
(1) නිරාහාරව සිටි භික්ෂු පිරිස වෙනත් රටවලට පලා යාම ය.
(2) දැඩි නියගයකින් භික්ෂූන් වහන්සේලා පීඩා විඳීම ය.
(3) පළමු නිකාය භේදය ඇතිවීම ය.
(4) මහා විහාරය ආරම්භ කිරීම ය.

34. ශ්‍රී ලාංකික සිංහලයෝ තම ගොවිතැන්වලින් ලබා ගන්නා අස්වැන්නේ පළමු කොටස ශ්‍රී මහා බෝ රදුන්ට පූජා කිරීම සිරිතක් ලෙස සිදු කරති. එය හැඳින්වෙන්නේ,
(1) අග්‍රශස්‍ය දානය ලෙසයි. (2) මුළුතැන්බත් දානය ලෙසයි.
(3) දේවතාබලි දානය ලෙසයි. (4) ක්ෂීර පායාස දානය ලෙසයි.

35. රජු විසින් සියලු රට වැසියා තම දරුවන් සේ සලකා කටයුතු කිරීමේ ලක්ෂණය ද ඇතුළත් රාජ ධර්මය,
(1) තපස නමින් හැඳින්වේ. (2) අක්‍රෝධ නමින් හැඳින්වේ.
(3) අවිහිංසා නමින් හැඳින්වේ. (4) අවිරෝධතා නමින් හැඳින්වේ.

36. මිහිඳු මහරහතන් වහන්සේගේ ලංකාගමනයට සම්බන්ධව ශ්‍රී ලාංකිකයන් ලැබූ දායාද අතරට අයත් **නො වන** කරුණ වන්නේ,
(1) ශ්‍රේෂ්ඨ දහමක් ලැබීම යන්නයි. (2) දළදාව ලැබීම යන්නයි.
(3) භාෂා සාහිත්‍යය ලැබීම යන්නයි. (4) කලා ශිල්ප ලැබීම යන්නයි.

37. බුද්ධකාලීන වජ්ජි සමූහාණ්ඩුවේ ස්ථාවර බවට හේතු ලෙස බුදුරජාණන් වහන්සේ විසින් හඳුන්වා දෙනු ලැබූ රාජ්‍ය පාලන ප්‍රතිපත්තිය,
(1) දස රාජධර්ම ලෙස දැක්වේ. (2) දස සක්විතිවත් ලෙස දැක්වේ.
(3) සතර සංග්‍රහ වස්තු ලෙස දැක්වේ. (4) සප්ත අපරිහානීය ධර්ම ලෙස දැක් වේ.

38. "සිංහලයිනි, නැගිටිව්. බුද්ධගයාව බේරා ගනිව්." යන උද්‍යෝග පාඨය ඉදිරිපත් කරමින් බුද්ධගයාව බේරා ගැනීමට කටයුතු කළේ,
(1) වලිසිංහ හරිස්චන්ද්‍රතුමා ය. (2) හෙන්රි ස්ටීල් ඔල්කට්තුමා ය.
(3) අනගාරික ධර්මපාලතුමා ය. (4) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි ය.

39. දෙවන ධර්ම සංගායනාවේදී දශවස්තුව පිළිගත් දුර්මතධාරී වජ්ජිපුත්තක භික්ෂූන් දස දහසක් නෙරපන ලද අතර, ඒ තුළින් ශාසන ඉතිහාසයේ සිදු වූ වැදගත්ම සිදුවීම,
(1) සංගායනා කිහිපයක් පැවැත්වීමයි. (2) නිකාය භේදය ඇතිවීමයි.
(3) දුසිල් භික්ෂූන් සිවුරු හැරවීමයි. (4) දුර්මතධාරීන්ට ඉඩ ඇහිරීමයි.

40. ස්තූපයේ අලංකාරය හා ආරක්ෂාව සඳහා, තොරණක ආකාරයෙන් සතර දිශාවේ ඉදිකළ ශ්‍රී ලංකාවේ ස්තූපවලට පමණක් ආවේණික නිර්මාණය,
(1) වාහල්කඩ නම් වේ. (2) වටදාගෙය නම් වේ.
(3) කොරවක්ගල නම් වේ. (4) පියගැටපෙළ නම් වේ.

*****

EXAMMOOD.LK

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2011 දෙසැම්බර්

General Certificate of Education (Ord. Level) Examination – December 2011

බුද්ධ ධර්මය II / පැය දෙකයි

Buddhism II / Two hours

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* **පළමුවැනි** ප්‍රශ්නයට ලකුණු 20ක් ද, තෝරා ගන්නා **අනෙක් ප්‍රශ්නයකට** ලකුණු 10 බැගින් ද හිමි වේ.

01. (i) සත් සති ගත කළ බුදුරජාණන් වහන්සේට පළමු දන් පිළිගැන්වූ, බුදුන් දහම් සරණ ගිය (ප්‍රථම ද්වේවාචික) උපාසකවරුන්ගේ නම් ලියන්න.

(ii) බුදුරජාණන් වහන්සේගේ පළමු ධර්ම දේශනාව ලෙස ප්‍රකට සූත්‍රයේ නම කුමක් ද?

(iii) සිංහල ජන ජීවිතය සකස් කර ගැනීමට ඉවහල් වූ, බුදුරජාණන් වහන්සේගේ අතීත ජීවන සිද්ධි පාදක කොට කුරුණෑගල යුගයේ ලියවුණු ගද්‍ය ග්‍රන්ථය කුමක් ද?

(iv) "වන්දාමි චේතියං සබ්බං....." යන ගාථාව සම්පූර්ණ කර ලියන්න.

(v) බුද්ධ ධර්මයේ සඳහන් වන ප්‍රධාන භාවනා ක්‍රම **දෙක** මොනවා ද?

(vi) "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි" මෙම පාඨයේ අදහස ලියන්න.

(vii) කාලාම සූත්‍රයෙන් හෙළිකෙරෙන, ලොව වෙනත් කිසිදු ආගමක දක්නට නොලැබෙන බුදු දහමේ පමණක් දක්නට ලැබෙන සුවිශේෂී ගුණය කුමක් ද?

(viii) "මාගේ මේ ව්‍යායාමය රජ සැප පිණිස නොව, සම්බුද්ධ ශාසනයේ චිර පැවැත්ම සඳහා යි" මෙම ප්‍රකාශය කළ රජතුමාගේ නම කුමක් ද?

(ix) අනුරාධපුරයේ පිහිටි අභයගිරිය හා ජේතවනය යන ස්තූප ගොඩනැංවූ පාලකයින් **දෙදෙනා** නම් කරන්න.

(x) "වටදගෙය" කෙටියෙන් හඳුන්වන්න.

02. පෝයදාට පෙර දින පාසලේ පැවැති ආගමික වැඩසටහනට වැඩම කළ ගරුතර ස්වාමීන් වහන්සේ තම ධර්ම දේශනයේ දී මෙසේ වදාළ හ.

"බුදුරජාණන් වහන්සේගේ චරිතය, අප හදාරන්න ඕන උදාර පරමාර්ථයක් ඇතුවයි. ඒ තමයි උන්වහන්සේගේ චරිතයේ සිද්ධි තුළින් අප, ජීවිතවලට ගත හැකි ආදර්ශ ඉස්මතු කර ගැනීම." මේ අනුව ඔබගේ මතකයට නැගෙන,

(i) බුදුරජාණන් වහන්සේගේ චරිතයෙන් ප්‍රකට කෙරෙන ආදර්ශ **දෙකක්** දක්වන්න.

(ii) ඉහත ආදර්ශවලින් **එකක්** ප්‍රකට වූ අවස්ථාවක් කෙටියෙන් දක්වන්න.

(iii) පුද්ගල ජීවිතයක් ශ්‍රේෂ්ඨත්වයට පත්කර ගැනීමට, ඔබ දැක්වූ ආදර්ශ ඉවහල් වන අයුරු පෙන්වා දෙන්න.

03. වෙසක් පොහෝ දින සිල් සමාදන් වූ සිසු පිරිස වෙනුවෙන් භාවනා වැඩසටහන මෙහෙය වූ ගරුතර ස්වාමීන් වහන්සේ මෙසේ දේශනා කළහ.

"අද අපි පුරුදු පුහුණු කරන්නේ මෛත්‍රී භාවනාවයි. මෛත්‍රී වැඩීම පිළිබඳ සම්පූර්ණ විස්තරයක් කරණීය මෙත්ත සූත්‍රයේ දැක්වෙනව. ඊට අමතරව මෙත්තානිසංස සූත්‍රයෙහි ද, මෙත් වැඩීමෙන් ලැබෙන ආනිසංස එකොළහක් දැක්වෙනව"

(i) එම මෙත් ආනිසංස අතුරෙන් **දෙකක්** දක්වන්න.

(ii) කරණීය මෙත්ත සූත්‍රයේ දැක්වෙන පරිදි අසීමිතව (අපරිමාණං) මෛත්‍රීය වඩන ආකාරය පැහැදිලි කෙරෙන උපමාව කුමක් ද?

(iii) මෛත්‍රීය වැඩීම පිළිබඳ ව කරණීය මෙත්ත සූත්‍රයෙහි දක්වා ඇති ආකාරය පැහැදිලි කරන්න.

EXAMMOOD.LK

04. (i) දස පාරමිතා ධර්ම අතුරෙන් **දෙකක්** නම් කරන්න.

(ii) පාරමිතා ධර්ම පුරන ආකාරය අනුව සෑම පාරමිතාවක් ම කොටස් තුනකට බෙදේ. ඒ කොටස් **තුන** නම් කරන්න.

(iii) දූහැමි මිත්‍රශීලී සමාජයක් ඇති වීමට පාරමිතා **ධර්මයක්** ඉවහල් කරගත හැකි අයුරු පහදන්න.

05. (i) වෛරය නොසන්සිඳෙන හා සන්සිඳෙන පිළිවෙත පැහැදිලි කරමින් දේශනා කළ ධම්මපද ගාථාව ලියන්න.

(ii) එම ගාථාවේ අදහස ලියන්න.

(iii) සාමකාමී සමාජයක් ඇති කරලීමට මෙම ධම්මපද දේශනාව ඉවහල් වන ආකාරය පහදන්න.

06. සාර්ථක පවුල් ජීවිතයක් ගත කිරීම සඳහා අවශ්‍ය පදනම සකසා ගෙන තිබූ තරුණ යුවළක් ගෘහ ජීවිතය ආරම්භ කළහ. මේ සඳහා ඔවුන්ට මාර්ගෝපදේශය සැපයුවේ සිඟාලෝවාද සූත්‍රයයි.

(i) බුදුරජාණන් වහන්සේ මෙම සූත්‍රයේ දී අන්‍යෝන්‍ය වශයෙන් තම යුතුකම් ඉටු කළ යුතු යයි දේශනා කළ සමාජ කණ්ඩායම් අතුරෙන් **දෙකක්** නම් කරන්න.

(ii) ඉහත සූත්‍රයේ දී, දූ දරුවන් විසින් තම දෙමාපියන්ට ඉටු කළ යුතු යයි දේශනා කළ යුතුකම් අතුරෙන් **තුනක්** දක්වන්න.

(iii) සදිසා නමස්කාරය තුළින් පැහැදිලි කරන සමාජ සම්බන්ධතාවල ධාර්මික සැකැස්ම පැහැදිලි කරන්න.

07. මෙහි දක්වෙන බුදුපිළිම සටහන නිරීක්ෂණය කර, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) මෙම පිළිමයේ ඉරියව්ව කුමක් ද?

(ii) මෙම පිළිමයේ මුද්‍රාව හා ආසනය නම් කරන්න.

(iii) සාමකාමී මනසකින් යුත් බෞද්ධ සමාජයක් බිහිකරලීම සඳහා බුදුපිළිම මගින් කරනු ලබන බලපෑම පහදන්න.

*****

EXAMMOOD.LK